183782
02/03/2007

රු. 3000/-

# ද්විතියික අධ්‍යාපනය කෙරෙහි

# බලපාන

# සමාජ හා මනෝමූලික සාධක

# (හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල අධ්‍යාපන කලාපයේ පාසැල් ඇසුරින්)

නම : එච්. ආරියවති

සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ පාර්ශ්වීය අවශ්‍යතාවයක් සපුරාලීම සඳහා 2006.02.17 දින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය වෙත ඉදිරිපත් කරනු ලබන ස්වාධීන පර්යේෂණ නිබන්ධය.

183782

## 1.1 හැඳින්වීම

සම්පූර්ණ මිනිසෙකු බිහි කිරීමේ ආධ්‍යාශයෙන් කෙරෙන ශාරීරික බුද්ධිමය භාවාත්මක හා ගුණාත්මක සංකල්ප අධ්‍යාපනයේ පොදු අරමුණු වශයෙන් විග්‍රහ කළ හැකිය. අධ්‍යාපනයේ ජාතික සංවර්ධනයක් කරා යොමු කිරීමේ කර්තව්‍යයේදී අධ්‍යාපනය නිසා පොදු හික්මීමත්, තිරණ ගැනීමේ ශක්තියත් හා සමාජීය වගකීම් වලින් ඈත්වීමට අද බොහෝ දුරට පෙළඹී තිබේ. කුඩා දරුවන් ළාබාල වයසේදීම තියුණු තරගකාරී තත්ත්වයකට ඇද දමා ඇත. ජාතික අනන්‍යතාවය ආගමික ප්‍රවණතාවන් තම පෞද්ගලික ආර්ථික දියුණුව වැනි උග්‍ර පෞද්ගලික ප්‍රශ්න වලට යට නොවී සම්පූර්ණ ව්‍යුහය දෙස නිදහස්ව හා මධ්‍යස්ථව බැලීමට අවශ්‍ය ශක්තිය කෙනෙකුට අධ්‍යාපනයෙන් ලැබිය යුතුය.

මෙසේ අවශ්‍ය ශක්තිය ලබාදෙන ආකාරයට නූතන අධ්‍යාපනය හැඩ ගැසී නැත. එබැවින් අනාගත පරපුරට සිය ජීවිත ප්‍රශ්න වලට විසඳුම් ලබා ගත හැකි පදනමක් ඇති කිරීමේ කාලය එළඹී ඇත. අධ්‍යාපනය වනාහී අනාගතය අපේක්ෂා කරගෙන සකස් විය යුතුය. විශේෂයෙන්ම බාල පරපුර සඳහා අධ්‍යාපනය ලබා දිය යුත්තේ අනාගතයේදී ඔවුනට මුහුණපෑමට සිදුවන ජීවන අභියෝගයන්ට මුහුණදීමට ඔවුන් තුළ ශක්තියක් ඇති කරන ආකාරයට වේ.

දැනට ලංකාවේ අනන්‍යතාවය ඔස්සේ ඉතිහාසය විසින් නිර්මාණය කර දී ඇති උරුමය බරපතල ලෙස පලුදුවෙමින් ගැටුම් හා භේදකාරී පරිසරයක් දිවයිනෙහි එක් පසෙක වසර ගණනාවක් තිස්සේ වර්ධනය වෙමින් පවති. මෙම සමාජය එකිනෙකට යම් යම් වගකීම් වලින් බැඳුණු සංවිධානයකි. තම තමන්ගේ සමාජමය අගයන් හා වගකීම් ද අනුන් වෙනුවෙන් කළ යුතු මෙහෙවරක්ද ඇති බව හැමදෙනාම සිතිය යුතු වේ. මේ සඳහා පාසලේ අධ්‍යාපන අවස්ථා ඇති කර බාල පරපුර තුළ සාධාරණ ආකල්ප චර්යා රටා ඇති කළ යුතුය.

පුරවැසියෝ විවිධ පරිසරවල වෙනස් වූ ජීවනෝපාය ක්‍රමයක් මත ජීවත් වෙති. ජීවිතය තමන්ට මෙන්ම අනුන්ටද බරක් නොවිය යුතුවා සේම ළඟා කර ගත නොහැකි ඉලක්කය ඔස්සේ හඹායමින් වල්මත් නොවිය යුතුය. කැළඹිලි සහිත නොවිය යුතුය. පාසලට මේ සඳහා බොහෝ දේ කළ හැකි වන්නේ අරමුණු ගත වූ විටයි. සාරධර්ම උකහා ගැනීමේ අවබෝධය හා සංවේදිතාව ඇති කිරීම තමා හා අනුන්ගේ අභිවෘද්ධීන් සඳහා නිරන්තරව දියුණුවීමේ ආකල්පයන් ඇති කිරීම ශාරීරික මානසික සෞඛ්‍යයට අදාල වන පරිදි විවේකය, විනෝදය ප්‍රයෝජනවත්ව උපයෝගි කර ගැනීම. පරිසර සංරක්ෂණය උදෙසා නිර්මාණශීලිව සහභාගි වීමේ කැමැත්ත ඇති කිරීම ආදී වශයෙන් ළමයින් ජීවත් වන පරිසරය තුළ දියුණු වීමටත් පරිසරය වඩා ශක්තිමත් කිරීමට හැකියාවක් ඔවුන් තුළ ඇති කිරීමට අධ්‍යාපනයෙන් ඉඩ ප්‍රස්ථා සැළසිය යුතුය.

මානව සම්පතක් වූ සෑම ළමයෙකුගේම යම් සහජ දක්ෂතාවයන් සැඟවී පවතී. මානව සම්පත් හඳුනා ගැනීම, දක්ෂතා ඇති කිරීම සඳහා පාසල යම් සහායක් දී නැණස පෑදීම කළ යුතු වේ. ජාතියේ කොඳු නාරටිය අධ්‍යාපන ක්‍රමය බව මීට කලින් සඳහන් කරන ලද්දේ එබැවිනි.

ඉහත සඳහන් ආකාරයට විවිධ වර්ගීකරණයන්ට ලක්ව ඇති ශ්‍රී ලංකාවේ වත්මන් අධ්‍යාපන ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක අධ්‍යාපන ක්‍රමය තුළ දක්නට ලැබෙන විෂමතා පිළිබඳව හඳුනා ගනිමින් ඒවා සමස්ත අධ්‍යාපන ක්‍රියාවලියටම බලපා ඇති ආකාරය හඳුනාගත යුතුය. මේ සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල අධ්‍යාපන කලාපය තෝරා ගතිමි. ද්විතියික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන විවිධ වෙනස්කම් ග්‍රාමීය පරිසරයක් වන වලස්මුල්ල කලාපයේ පාසැල් තුළ කෙතරම් දුරට ක්‍රියාත්මක වෙනවාද ? සමස්ත සමාජය තුළ දක්නට ලැබෙන තත්ත්වයන් මෙම පාසැල් තුළ කොතරම් දුරට දක්නට ලැබේද යන්න මෙහිදී විශේෂයෙන් සොයා බැලේ.



[stamp]

# පටුන

පිටුව

1 වන පරිච්ඡේදය 1-9

1.1 හැඳින්වීම

1.2 අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථ

1.3 අධ්‍යයනයේ වැදගත්කම

1.4 මූලාශ්‍ර හා ක්‍රමවේදය

1.5 ගැටළු හා සීමාවන්

2 වන පරිච්ඡේදය 10-19

2.1 ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන ක්‍රමයේ විකාශනය හා ද්විතියික අධ්‍යාපනයේ ස්වභාවය

2.2 අධ්‍යාපනය යනු කුමක්ද ? 20-34

2.3 අධ්‍යාපනයෙහි අපේක්ෂිත කාර්යභාරය

2.4 ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය හා පාසල් ව්‍යුහය

3 වන පරිච්ඡේදය 35-47

ශ්‍රී ලංකාවේ ද්විතියික අධ්‍යාපනය කෙරෙහි බලපාන ලද සාධක

4 වන පරිච්ඡේදය 48-88

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල අධ්‍යාපන කලාපයේ තෝරා ගන්නා ලද පාසල් වල ද්විතියික අධ්‍යාපන පහසුකම් පිළිබඳ විශ්ලේෂණය

5 වන පරිච්ඡේදය 89-103

පාසල් වර්ගීකරණයන් ද්විතියික අධ්‍යාපනය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ දත්ත විග්‍රහය

6 වන පරිච්ඡේදය


| | |
|---|---|
| සමාලෝචනය | 104-108 |
| ආශ්‍රිත ග්‍රන්ථ | 109-113 |
| උපග්‍රන්ථ 01 | 114-118 |
| උපග්‍රන්ථ 02 | 119-123 |